# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි පුරප්පාඩුව පවතින අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි (MN3-2016) සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. තනතුර : සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී III ශ්‍රේණිය

(අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය MN 3-2025 -2016)

**02. වැටුප් පරිමාණය :** රු. 52,250-10X 800-11X1,190 -10X1,320-10X1,350-100,040/-

(සැ.යු.2026.12.31දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025උපලේඛණ අනුව ගෙවීම් කරනු ලැබේ.)

**03. වයස** : අවු: 18ත් - 30ත් අතර විය යුතුයි.

**04. අධ්‍යාපන සුදුසුකම් :**

(අ) ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම

**සහ**

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**වෘත්තීය සුදුසුකම්**

i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

**හෝ**

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

**හෝ**

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

**හෝ**

iv. තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකාර්මික ඩිප්ලෝමාව

**හෝ**

v. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

**හෝ**

vi. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

vii. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

**හෝ**

viii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරණ ආයතනවලින් විමසා අදහස් ලබා ගැනිමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**05. පළපුරුද්ද :** විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

**06. කායික සුදුසුකම් :** දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන පරිදි මනා කායික සහ මානසික යෝග්‍යතාවයකින් සිටීම.

**07. වෙනත් :**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**8. පුරප්පාඩු ගණන දෙකකි (02)**

**9. බඳවා ගන්නා ක්‍රමය :** සුදුසුකම් සපුරාලන්නන් ලිඛිත විභාගයකින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

(අ) ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

(ආ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා නොදෙන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

තමා විසින්ම සකස්කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු හා සනාථ වන ලේඛන සහිත අයදුම්පත් 2026.05.31 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී III ශ්‍රේණිය ලෙස සඳහන් කල යුතුය. මෙම තනතුරුවලට අදාල බඳවා ගැනීම් පටිපාටි අමාත්‍යාංශයේ **www.most.gov.lk** වෙබ් අඩවියේ දැක්වේ.

**ලේකම්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය,**
**3 වන මහල, සෙත්සිරිපාය, I වන අදියර,**
**බත්තරමුල්ල.**